# සිංහල ගේය කාව්‍යයන්හි එළුසඳස්ලකුණට අනුරූප වූ ඡන්දස් ලක්ෂණ යෙදී ඇති ආකාරය පිළිබඳ විමර්ශනයක්

(ගී, සිව්පද හා දෙපා ඇසුරින්)

**හෙ. ව. බිහේෂ් ඉන්දික සම්පත්**

Prosody which is an essential feature of a poem consist of metre, form and rhyme. The objective of this research study is to explain the verses (Gee), four line stanzas (Sivpada) and two line stanzas (Depada) illustrated in Elusandaslakuna which is the oldest text available on the subject and to discuss similar characteristics in Sinhala compositions. This study further elaborates on the significance of traditional Sinhala prosody even in modern literary genres such as songs.

## ප්‍රවේශය

ඡන්දස යනු කවියක මූල ප්‍රතිෂ්ඨාව වන යති, විරිත් ආදිය තුළින් බිහි වන, කවියේ ආකෘතියයි. අලංකාර හා සමගාමී ව ඡන්දස් ශාස්ත්‍රය ද වසර දහස් ගණනක් තිස්සේ වර්ධනය වී තිබේ. නාට්‍ය ශාස්ත්‍රය, ඡන්දස් සූත්‍රය, වෘත්තරත්නාකරය, ඡන්දෝමඤ්ජරී වැනි සංස්කෘත මූල ග්‍රන්ථවල මෙන් ම සියබස්ලකර, එළුසඳස්ලකුණ, ලකුණුසර, කව්ලකුණු මිණිමල් වැනි චිරන්තන සිංහල විචාර ග්‍රන්ථවල ද ඡන්දස පිළිබඳ ව සාකච්ඡා වී තිබේ. මේ අතුරින් දඹදෙණි යුගයේ හද්‍ර හිමියන් විසින් රචනා කරන ලද එළුසඳස්ලකුණ සිංහල ඡන්දස උදෙසා ම රචනා වී ඇති, දනට විද්‍යමාන පැරණිතම ග්‍රන්ථයයි. එහි ගී, සිව්පද, දෙපා වැනි විරිත් සම්ප්‍රදායයන් පිළිබඳ ව විග්‍රහ කොට තිබේ. එම ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කරමින් ඒ හා

© ආචාර්ය හෙ. ව. බිහේෂ් ඉන්දික සම්පත්

සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු

මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 22 කලාපය, 2014/2015

මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය



සමාන වූ වෘත්ත ලක්ෂණ නූතන සිංහල ගීතවල යෙදී ඇති ආකාරය විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. මෙය ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ඔස්සේ කෙරෙන්නා වූ අධ්‍යයනයකි. ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් සංස්කෘත හා සිංහල ඡන්දස් ග්‍රන්ථ, සිංහල ගීත නිර්මාණ ආදිය ද ද්විතීයික මූලාශ්‍රය වශයෙන් ඒවා පිළිබඳ පශ්චාත් කාලීනයන්ගේ මත ද අධ්‍යයනය කෙරේ. මෙම මාතෘකාව ඔස්සේ මේ දක්වා පර්යේෂණයක් සිදු වී නොමැති හෙයින් මෙම අධ්‍යයනය ක්ෂේත්‍රයට නව දැනුම සපයනු ඇතැ'යි අදහස් කෙරේ. මෙහි පර්යේෂණ සීමා ලෙස ඡන්දස් පාර්ශ්වයෙන් එළුසඳස්ලකුණේ දැක්වෙන ගී, සිව්පද හා දෙපා විරිත් ද, සිංහලගේය කාව්‍ය පාර්ශ්වයෙන් 20 වන සියවසේ අපරාර්ධයට සම්බන්ධ උසස් යැ'යි පිළිගත හැකි ගීත ප්‍රබන්ධ කිහිපයක් ද තෝරා ගෙන ඇත. සැහැලි විරිත් මෙම අධ්‍යයනයෙන් බැහැර කෙරුණේ අනති විස්තීර්ණත්වය තකා ය. ඡන්දස කාව්‍යයේ රිද්මය හා ශබ්දධ්වනිය සමග ඍජු ව ම සම්බන්ධ වන්නකි. කවියාගේ අත්දැකීම් පරිසරය හා බැඳුණු ඇතැම් රිද්ම රටා චිරන්තන කවීන්ට මෙන් ම අද්‍යතන කවීන්ට ද සාධාරණ වේ. නූතනගේය කාව්‍ය එළුසඳසේ දැක්වෙන ඡන්දස් සම්ප්‍රදායයන් හා තුලනාත්මක ව අධ්‍යයනය කළ යුතු වනුයේ මෙම පදනම සැලකිල්ලට ගනිමිනි. ගීතය වැනි නූතන සාහිත්‍යාංගයක දී පවා එළුසඳස්ලකුණේ දැක්වෙන සාම්ප්‍රදායික කාව්‍යාකෘති වැදගත් වන ආකාරය මෙම පර්යේෂණයෙන් නිගමනය කළ හැකි වනු ඇත.

## සිංහල ඡන්දස් ශාස්ත්‍රය

සිංහල ඡන්දස් ව්‍යාපාරයෙහි ආරම්භක අවස්ථාව අනාවරණය කර ගත යුතු වන පැරණිතම ග්‍රන්ථ දැනට විද්‍යමාන නොවේ. එහෙත් කලාගුරුසුලුපායේ විසූ කල්‍යාණමිත්‍ර නම් හිමි කෙනෙකුන්ගේ, පියුම් ගී ආදි ලක්ෂණ පැවසුණු කාව්‍යෝපදේශ ග්‍රන්ථයක් පිළිබඳ ක්‍රිස්තු වර්ෂ 10 වන සියවසෙහි රචිත සියබස්ලකරෙහි සඳහන් වෙයි.[1] එසේ ම සියබස්ලකරකරුවා ගී, දෙපද, සිවුපද, සැහැලි වැනි ආකෘති කිහිපයක් නාමික ව පමණක් සඳහන් කරයි.[2] ඔහු ද කල්‍යාණමිත්‍ර හිමියන්ගේ ග්‍රන්ථය උත්කර්ෂයෙන් දැක්වීමෙන් පැහැදිලි වනුයේ එය එම යුගයේ සම්භාවිත ව පැවැති සිංහල වෘත්ත සංග්‍රහයක් වූ බවයි. සිංහලයේ දැනට විද්‍යමාන පැරණිතම ඡන්දස් ග්‍රන්ථය වන්නේ දඹදෙණි යුගයේ හද්‍ර හිමියන්

විසින් ලියන ලද එළුසඳස්ලකුණයි. එළුසඳස්ලකුණ යන්නෙහි අර්ථය "සිංහලයේ ඡන්දස් ලක්‍ෂණ ඉදිරිපත් කරන්නා වූ කෘතිය" යනුයි. එහි සිංහල භාෂාවට අනන්‍ය වූ සිවුපද, ගී හා සැහැලි විරිත් පිළිබඳ ව සාකච්ඡා කොට තිබේ.

එළුසඳස්ලකුණේ දැක්වන උතු, මැදුම්, පිහිටි, සුපිහිටි, දඬු යන ඡන්දස් නාම සංස්කෘත උක්තා, මධ්‍යා, ප්‍රතිෂ්ඨා, සුප්‍රතිෂ්ඨා, දණ්ඩා යන ඡන්දස් හැඳින්වීම අනුව ගියේ වෙයි. අරී, සිරී, උවදැ, සදොල්කෙළි, තිරියත්සර, මිණිමල්වියත්, බුජඟයා යන වෘත්ත නාම සංස්කෘත ආර්යා, ශ්‍රී, උපජාති, ශාර්දූල වික්‍රීඩිත, ත්වරිතගති, මිණිමල් විතාන, භුජංගප්‍රයාත යන වෘත්ත නාම අනුව ගියේ වෙයි. එහෙත් ඒ නමින් පමණකි. ලකුණු විසින් සපුරා ම වෙනස් වෙයි. හෙළ විරිත් සකුව ඇසුරු කළ ද මූල වෘත්තවලින් වෙනස් වූ ස්වාධීන ලක්‍ෂණ පිළිබිඹු කිරීමට හේතුව වශයෙන් යූ. ඩී. ජයසේකර, පරණවිතාන, සෝරත හිමි වැනි විද්වතුන් පෙන්වා දී ඇත්තේ මහින්දාගමනය සමග ප්‍රාකෘත සාහිත්‍යයන්හි බලපෑම්වලට ලක් වීමයි. සිංහලයෙහි සහ සංස්කෘතයෙහි එක ම ලෙසින් විද්‍යමාන වන තෝටක විරිත ද ප්‍රාකෘතයෙන් සිංහලයට පිවිසි විරිතක් ලෙස කීත් වැනි විද්වතුන් පෙන්වා දී තිබේ. එසේ ම යා ගී, යොන් ගී, මත්වල ගී ආදී විරිත් නම් ද අප්‍රකට අරුත් දනවන හෙළ වදන් බැව් විද්වතුන්ගේ අදහසයි.

එළුසඳස්ලකුණේ නොදැක්වෙන විරිත් ද සිංහලයේ දූරාතීතයක පටන් භාවිත ව ඇති ආකාරය ශිලා ලේඛනවලවලින් ද සීගිරි කුරුටු ගී ආදී කාව්‍ය නිර්මාණවලින් ද පැහැදිලි වේ. ඒ සම්බන්ධයෙන් එළුසඳස්ලකුණකරුවාට දොස් දැක්විය හැකි නොවන්නේ තමාගේ අදහස පොදුවේ සිංහලයේ ඡන්දස් ලක්‍ෂණ විග්‍රහ කිරීම පමණක් බවත් එම ලක්‍ෂණවලට අනුගත වූ ඕනෑ ම විරිතක් නොවිරිතක් නොවන බවත් ඔහු ප්‍රකාශ කොට ඇති බැවිනි.[3]

සඳස්ලකුණකරු තම කෘතිය ආරම්භයේ දී ම ලඝු-ගුරු සටහන් කිරීමේ සහ අගය කිරීමේ පිළිවෙළත්[4], ම, න, බ, ය, ජ, ර, ස, ත යන ගණ අට පිළිබඳ තොරතුරුත්[5] සාකච්ඡා කොට තිබේ. ගණ පිළිබඳ විග්‍රහය සංස්කෘතයට අනුරූප වෙතත් ලඝු-ගුරු සලකුණු කිරීමෙහි පරස්පරතාවක් දක්නට ලැබේ. සංස්කෘත ඡන්දස් සම්ප්‍රදායයට අනුව ගුරු මාත්‍රාව කෙටි ඉරෙනුත් ලඝු මාත්‍රාව වක් ඉරෙනුත් දක්වන නමුදු සිංහල ඡන්දස් ක්‍රමයට අනුව ඒවා මාරු කොට දක්වා ඇත.



ගුරු තුන බැගින් වනුයේ ම'ගණය බව ද ලඝු තුන බැගින් වනුයේ න'ගණය බව ද, බ, ජ, ස යන ගණවල පිළිවෙළින් ආදි, මධ්‍ය, අන්ත ස්ථානවල ගුරු හා සෙසු තන්හි ලඝු යෙදෙන බව ද ය, ර, ත යන ගණවල පිළිවෙළින් එකී ස්ථානවල ලඝු සහ සෙසු තන්හි ගුරු යෙදෙන බව ද සඳස්ලකුණුකරු පවසා ඇත්තේ සංස්කෘත ඡන්දස් ක්‍රමයට සමාන වන පරිද්දෙනි.[6]

## ගී විරිත්

ගී විරිත මාත්‍රා තිහ සිට හතළිස් හතර දක්වා අගයකින් යුක්ත වන අතර[7] පාද සතරකින් සමන්විත ය. ගීයේ පාද සතර අතුරින් 1, 3 විෂම පාද යනුවෙන් ද 2, 4 පාද සමපාද යනුවෙන් ද හඳුන්වනු ලැබේ. ගීයේ පාද සතර අන්‍යෝන්‍ය වශයෙන් වෙනස් වන්නේ නම් විසම ගී විරිත් යනුවෙන් ද සමපාද හා විසමපාද එකිනෙකට අනුරූප ව සමාන වන්නේ නම් අඩසම ගී විරිත් යනුවෙන් ද හඳුන්වනු ලැබේ.

එළුසඳස්ලකුණෙහි ගී (9, 11, 11, 11)[8], පියුම් ගී (8, 11, 8, 14)[9], මත්වල ගී (8, 8, 8, 13)[10], උමතු ගී (9, 10, 9, 10)[11], කව් ගී (9, 10, 10, 11)[12],බමර ගී (8, 11, 10, 13)[13], යා ගී (9, 11, 11, 11)[14] දුවඟ ගී (9, 11, 11, 13)[15], යොන් ගී (8, 11, 10, 11)[16], කාරිකා ගී (8, 11, 9, 13)[17], දකුණු තොහොල් ගී (8, 11, 9, 13)[18], වම් තොහොල් ගී (8, 11, 9, 13)[19], සඳහට ගී (9, 11, 11, 11)[20], නළු ගී (එකතුව 30)[21], සසපුලුතු ගී (10, 10, 10, 10)[22], උනුවිලඹු (8, 11, 9, 11)[23], ගජගැමි (8, 11, 11, 11)[24] යන ගී විරිත් සනිදර්ශන ව ඉදිරිපත් කොට තිබේ. (වරහන් තුළ දක්වා ඇත්තේ ඒ ඒ පාදවල යෙදෙන්නා වූ මාත්‍රා අගයයි.) ඇතැම් එළුසඳස්ලකුණ සංස්කරණවලට අනුව[25] දැක්වෙනුයේ මින් පළමු විරිත් පහළොව පමණි. එහෙත් සිව්පද විරිත් යටතේ "පිහිටි" නම් වූ ඡන්දසට ඇතුළත් කොට එම සංස්කාරකවරුන් දක්වා ඇති උනුවිලඹු, ගජගැමි යන විරිත් දෙක ද ගී විරිත් යටතට ඇතුළත් විය යුතු බව සෝරත හිමියෝ පෙන්වා දෙති.[26]

යා ගී හා ගී යන විරිත්වල මාත්‍රා අගයයන් සමාන වුවත් යා ගීයෙහි ලඝ්වක්ෂර පමණක් යෙදෙන බැවින් එය ගී විරිතෙන් වෙනස් වේ. දකුණු-වම් තොහොල් ගී, සඳහට ගී ආදී නම්වලින් දක්වා ඇත්තේ යමක ලක්ෂණය යෙදෙන්නා වූ ගී බව පෙනේ. යමක යනු වෙන් වෙන් වූ අර්ථ ඇති ස්වර, ව්‍යඤ්ජනයන්ගේ පුනරාවෘත්තියයි.[27] එහෙයින් පූර්වෝක්ත වෘත්ත ත්‍රයෙහි ඒ ඒ පාදවල මාත්‍රා අගය වැදගත් නොවේ. නළු ගී, සසපුලුතු ගී යන විරිත් දෙකෙහි ගණ නියමයක් ද සඳහන් කොට තිබීම විශේෂිත ය. ආදි සිංහල කවීන් මාත්‍රා ඡන්දස බොහෝ දුරට අනුගමනය කළ නමුදු වර්ණ ඡන්දස මුළුමනින් ම බැහැර නොකළ බවට මෙය සාධකයකි.

එළුසඳස්ලකුණ දක්වන ඇතැම් ගී විරිත්වලට සමාන ලක්ෂණ අද්‍යතන සිංහලගේය කාව්‍ය අතරෙහිදු දක්නට ලැබේ. නිදර්ශන වශයෙන් ***උමතු ගී*** නම් වනුයේ විෂමපාද මාත්‍රා 9 බැගින් සහ සමපාද මාත්‍රා 10 බැගින් වන අඩසම විරිතකි. අජන්තා රණසිංහ රචනා කළ "රතු රෝස පොකුරින්" නම් ගීයේ ස්ථායි කොටස උමතු ගී විරිතට අනුගත ව රචනා වී ඇත.

"රතු රෝස පොකුරින් - පිනි බිඳක් වැහුණා
මා දෑස රිදුවන - මිලින පෙම් කඳුළු සේ"[28]

එළුසඳස්ලකුණේ එන යතිය හේතුවෙන් ලුහු, ගුරු වශයෙන් ද ගුරු, ලුහු වශයෙන් ද ගත හැකි වීමේ නියමය සලකා පහත ගීත ඛණ්ඩයේ විෂමපාදාවසානය ලඝ්වත්වයෙන් ගත් විට එය උමතු ගී විරිතට අයත් කළ හැකි ය. එහි වනුයේ සුනිල් ආරියරත්න "පියවර ලකුණු" චිත්‍රපටයට රචනා කළ "නාමය නොමියේ" නම් ගීතයේ අවසන් ගීත ඛණ්ඩයයි.

"ඔබ ගිය මඟ දෙපසේ - පියවර ලකුණු දිගේ
අප යන දිගු ගමනේ - ජය පෙර නිමිති පෙනේ"[29]

***දුවඟ ගී විරිතෙහි*** විසම පාද මාත්‍රා 9, 11 ලෙසින් සහ සමපාද මාත්‍රා 11, 13 ලෙසින් යෙදේ. අජන්තා රණසිංහ විසින් රචනා කරන ලද "මා ඔබ දුටුවා" නම් ගීයේ ස්ථායි කොටසේ පළමු සහ සිව් වන පාදවල අවසන් අක්ෂරය ලඝ්වත්වයෙන් ගත් කල එය දුවඟ ගී විරිතට අයත් කළ හැකි වේ.



"මා අද ඔබ දුටුවා - කඳුළින් සේදුණු නෙතින්
පෑරුණු ආදර සිතින් - කලකට පසු මා ඔබ දුටුවා"[30]

***දකුණු තොහොල් ගී*** විරිත හා ***වම් තොහොල් ගී*** විරිත යන දෙක ම සඳස්ලකුණ කරුවා 8, 11, 9, 13 යන මාත්‍රා අගයෙන් යුතු වන නිදර්ශන පද්‍ය මගින් ඉදිරිපත් කොට ඇතත් ඒවායේ මුඛ්‍ය ලක්ෂණ වශයෙන් ගත යුතු වනුයේ ආදි ශබ්දය හා අන්ත ශබ්දය දෙවරක් බැගින් යෙදීම බව පෙනේ. මෙවැනි ලක්ෂණ නූතන ගීත අතර ද සුලබ ව දැක ගත හැකි වේ. රත්නකන සිද්ධාර්ථ හිමි රචනා කළ " කොහෙදෝ ඈතක සිට" නම් ගීයේ අන්තරා කොටස් නිදර්ශන වශයෙන් දැක්වීමට පුළුවන. එහි ආරම්භක පදය දකුණු තොහොල් ගී විරිතට සමාන ලෙස රූපද්වයක් බවට පත් කොට තිබෙනු දක්නට ලැබේ.

"මාල මාල බැඳ පාට පාට හැඩ - පියාපතින් සැදුණා
යාළු යාළු අපි නොකා නොබී හිඳ - එනතුරු මඟ රැඳුණා"

"පෝය පෝය හෙට යාය යාය මැද - සමනල මල් පිපිලා
සිනා කවට කෙළි ඉවත හෙළා ඉමු - සමනල කඳු නැඟිලා"[31]

එළුසඳස්ලකුණුකරු ***සඳහට ගීය*** 9, 11, 11, 11 යන මාත්‍රා අගයෙන් යුක්ත වන නිදර්ශන පද්‍යයක් මගින් දක්වා ඇතත් එහි ද මුඛ්‍ය ලක්ෂණය වශයෙන් ගත යුතු වනුයේ අනෙකක් බව පෙනේ. එනම් පසු පාදයන් විසින් පූර්ව පාදයන්හි අන්තය ඩැහැ ගනු ලැබීමේ ලක්ෂණයයි. රැයිපියෙල් තෙන්නකෝන් රචනා කළ "දුදනොද බිඳ" නම් ගීයෙහි තෙවන පාදයේ ආරම්භක වචනය දෙවන පාදයේ අන්තය ඩැහැ ගෙන ඇති ආකාරය අධ්‍යයනය කළ හැකි වේ.

"දුදනොද බිඳ - ලද තෙද කඳ
කඳ දෙව් රද - සාමිනේ"[32]

## සිව්පද විරිත්

ගණ හෝ වර්ණ වශයෙන් විෂම වුව ද මාත්‍රා අගයෙන් සමාන වන, සමාන වූ එළි, විරාම හා පද යෙදෙන්නා වූ පද්‍ය ආකෘතිය සිව්පද නම් වන බව එළුසඳස්ලකුණකරු සිව්පද විරිත් පිළිබඳ විග්‍රහය ආරම්භයේ දී පවසයි.[33] එක් ගුරක් හෝ මාත්‍රා දෙකක් පටන් ගුරු දහහතරක් හෝ මාත්‍රා විසිඅටක් දක්වා සිව්පද විරිත් පිළිබඳ ඡන්දස් 14ක් ඉදිරිපත් කොට තිබේ. ඒ එක් එක් ඡන්දසට අයත් විරිත් පැහැදිලි කිරීමේ දී සඳ නම් ඡන්දසට අදාළ ව එක් විරිතක් ද[34],

සිරි ඡන්දසට අදාළ ව බිඳු[35], මියුලු[36] යන විරිත් දෙක ද, මැදුම් ඡන්දසට අදාළ ව තලා[37], අතිඋනු[38] යන විරිත් දෙක ද පිහිටි ඡන්දසට අදාළ ව හසගැමි[39], පියුමකර[40] යන විරිත් දෙක ද සුපිහිටි ඡන්දසට අදාළ ව සෙවියත්සර[41], තිරියත්සර[42], කඳ[43] යන විරිත් තුන ද, උතු ඡන්දසට අදාළ ව අරී[44], බිඟුවෙණ[45], බුජඟයා[46], වෙහෙලුලැලි[47], වසත්[48], යොන්මත්වැල[49], සුරමත්වැල[50], උවදෑ[51], මින්ගති[52], යන විරිත් නවය ද, සෙල් ඡන්දසට අදාළ ව නළුගාහ[53], මිණිපොකුරු[54], කනීල්[55], මිණිමල්[56] යන විරිත් සතර ද, ගජ ඡන්දසට අදාළ ව සඳුල්කෙළි[57], දියකේලි[58], දොඹ[59], සක්වා[60], තරඟවැල[61], තෝටක[62], පෙද[63], දෙව්ගාහ[64], ලියකේලි[65] යන විරිත් නවය ද රැඳි නම් ඡන්දසට අදාළ ව මුවරදද[66], බහසුරුවිදඹ[67], කිඳුරුකෙළි[68], සමුදුරුගොස්[69] යන විරිත් සතර ද, රවුළු ඡන්දසට අදාළ ව නරඟරඟ[70], මිණිරිළු[71], වියන්[72], නලහව්[73] යන විරිත් සතර ද, තෙනෙත් ඡන්දසට අදාළ ව තුරඟරඟ[74], කුසුම්සිරිඟර[75], කමලා[76], සෝදැමිනී[77], දිගෝවිලි[78] යන විරිත් පහ ද, හිරු ඡන්දසට අදාළ ව දිගහුරු[79] විරිත ද, මී ඡන්දසට අදාළ ව පමදා[80], නුපුන්සඳ[81] යන විරිත් දෙක ද, මදු ඡන්දසට අදාළ ව ගඟහැලි[82], පුණුඅතිපුණු[83] යන විරිත් දෙක ද ඉදිරිපත් කොට තිබේ.

මෙකී තුදුස් ඡන්දස් ආශ්‍රයෙන් සිව්පද විරිත් සියදහස් ගණනක් හඳුනා ගත හැකි ආකාරය සඳස්ලකුණකරුවා පෙන්වා දී තිබේ.[84] මාත්‍රා විසිඅටට වැඩි විරිත් සකස් වන ආකාරය පිළිබඳ එළුසඳස පැහැදිලි විග්‍රහයක් නොදක්වන නමුදු පාදයක් මාත්‍රා 30ක් වන සේ විරාම තුනක් ඇති ව අවසනට එළි පිහිටුවා බඳිනු ලබන විරිත " අණවු දඬු" නමින් දක්වා ඇති හෙයින් සිංහල ඡන්දස් සම්ප්‍රදායයට අනුව මාත්‍රා 30 සිට 32, 34, 36, ආදි වශයෙන් මාත්‍රා දෙක බැගින් වැඩි වන සේ විකාසනය වන විරිත් "දඬු" (දණ්ඩක) නමින් හැඳින්වීමේ දෝෂයක් නොවන බව පෙනේ. එහෙත් එහි අවසන් විරිත මාත්‍රා කීයක් විය යුතු දැ'යි කිව නොහේ. සංස්කෘත ඡන්දස් ශාස්ත්‍රයට අනුව දණ්ඩක වෘත්තය ආරම්භ වනුයේ අක්ෂර විසි හතෙනි. එතැන් සිට එක් ගණය (අක්ෂර තුන) බැගින් වැඩි වෙමින් විකාසනය වන දණ්ඩක වෘත්ත අක්ෂර නවසිය අනූනවයේ දී නවතී.

***මැදුම් ඡන්දසට*** අයත් ***අතිඋනු විරිත*** පාදයක් මාත්‍රා සයක් වන සේ යෙදෙන්නකි. එය නූතන ගීත රචකයන් සුලබ වශයෙන්



භාවිත කරන්නා වූ සිව්පද විරිතක් වශයෙන් හඳුනා ගත හැකි වේ. රඹුකන සිද්ධාර්ථ හිමි රචනා කළ "පිහිටක් නැති සරණක් නැති" නම් ගීයේ සෑම ගීත ඛණ්ඩයක් ම ආරම්භ කර ඇත්තේ පාදයක් මාත්‍රා සයක් බැගින් වන අතිඋනු විරිත මාර්ගයෙනි.

"පිහිටක් නැති - සරණක් නැති
සතුටක්ඇති - මුහුණක් නැති

හබලක් නැති - ඔරුවක් ඇති
මිනිසෙක් වෙති - වෙරළක් නැති[85]

සුනිල් ආරියරත්න රචනා කළ "සිනමා තරු" නම් ගීතය ද මැදුම් ඡන්දසෙහි අතිඋනු විරිතට අනුගත ව ප්‍රබන්ධිත ය.

"හිනැහෙන තරු - වැලපෙනතරු
ගිළිහෙන තරු - දිලිහෙන තරු"[86]

අරිසෙන් අහුබුදු රචනා කළ "කුමරි වන්නම"[87], "මල් සුවඳයි"[88], "එම්බා ගංගා"[89] වැනි ගීවල ද අතිඋනු විරිත යෙදී තිබේ.

***පිහිටි ඡන්දසට*** අයත් *හසගැමි විරිත* පාදයකට සගණ දෙකක් බැගින් යෙදීමෙන් (| _ _ ∪ | _ _ ∪ |) සකස් වන්නකි. සුනිල් ආරියරත්න රචනා කළ "දෙවොලේ නොකැලැල්" නම් ගීයේ ස්ථායි කොටසේ එම විරිත යෙදී තිබේ.

"දෙවොලේ නොකැළැල් - පිදු ආදර මල්
සුවඳින් හැම කල් - පිබිදෙමි හැම කල්"[90]

***පිහිටි ඡන්දසට*** අයත් ***පියුමකර විරිත*** පාදයක් මාත්‍රා අටක් වන සේ යෙදෙන්නකි. එද සිංහල ගීත ප්‍රබන්ධ අතර සුලබ ව දක්නට ලැබෙන්නකි. ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ රචනා කළ "ජගන් මෝහිණී" නම් සරස්වතී ගීතයේ ස්ථායි කොටස රචනා වී ඇත්තේ පියුමකර විරිතෙනි.

"ජගන් මෝහිණී - මධුර භාෂිණී
චාරු දේහිනී - කමල වාසිනී"[91]

ගීතනාත් කුඩලිගම රචනා කළ "මරණයත් සුවයකි",[92] සුනිල් ආරියරත්න රචනා කළ "තණ්හා රතී රඟා",[93] "බෝධි සත්ත්වයෝ,"[94] අරිසෙන් අහුබුදු රචනා කළ "අම්බලමේ පිනා" යන ගීවල ද පියුමකර විරිත යෙදී තිබේ.

***සුපිහිටි ඡන්දසට*** අයත් ***කඳ විරිත*** පාදයකට මාත්‍රා 10ක් බැගින් යෙදෙන්නකි. අරිසෙන් අහුබුදු රචනා කළ "සැරදේ බක් මාසේ"[95], "රිලා හාමියේ"[96], "කෝ හතුරෝ" වැනි ගීතවල එම විරිත යෙදී ඇත.

"මරු හිටියත් පෙරමුණේ - ඔහු අමුණවු කඩු මුණේ
මරුවාටත් මරු වුණේ - සිංහලයා පෙරැ දිනේ"[97]

යමුනා මාලිනී රචනා කළ "මුතු"[98], "උදානය"[99] යන ගීවල ද, සුනිල් ආරියරත්න රචනා කර ඇති "අඳුර මැද ඔබ සොයමි"[100], "ශාරොන්හී කුසුමී"[101] යන ගීවල ද ඒ යෙදී තිබේ.

***උතු ඡන්දසට*** අයත් ***අරී*** නම් විරිතෙහි දී පාදයකට න'ගණ දෙකක්, බ'ගණයක් හා ගුරක් බැගින් යෙදේ. (|_ _ _|_ _ _|∪ _ _|∪|) අරිසෙන් අහුබුදු රචනා කළ "ජය අපටයි ලංකාවේ" නම් ගීයේ එම විරිත යෙදී ඇති අවස්ථාවක් මෙසේ ය.

"කුඹුර කොටන දෑත තමයි
ඔරුව පදින දෑත තමයි"[102]

එම ඡන්දසට අයත් ***බිඟුවෙණ විරිත*** සැකසෙනුයේ පාදයකට ස'ගණ තුනක් බැගින් යෙදීමෙනි. (|_ _ ∪|_ _ ∪|_ _ ∪|) අජන්තා රණසිංහ රචනා කළ "රන් දුනුකේ මල" නම් ගීයේ ප්‍රථම අන්තරා කොටස රචනා වී ඇත්තේ ඒ අනුව ය.

"සුදු සේල ගතේ එතුණා - ගෙල මාල හතක් බැඳුණා
රස වීළු කතා ඇසුණා - මුව කොල සිනා පිපුණා"[103]

***උතු ඡන්දසට*** අයත් ***වසත් විරිත*** නූතන කාව්‍ය-ගීත නිර්මාණවල ඉතා බහුල වශයෙන් විද්‍යමාන වන්නකි. වසත් නම් වනුයේ මාත්‍රා සයකින් විරාමය තැබෙන, කෝමල පදයන්ගෙන් යුතු විරිතයි. සුනිල් ආරියරත්න රචනා කළ "පොඩි දුවගේ සිනා පෙළයි"[104]," රැට රැට"[105], "දොළොස් මහේ පහන් නැගේ"[106], "පවුරු වළල්ලක් බැඳලා" වැනි ගීවල දී එම විරිත ඇසුරු කොට ගෙන තිබේ.

"කවුළු දොරින් බලා ඉඳිමි - ඔබ එන තුරු බලා ඉඳිමි
ඇතින් පියමනිනු දකිමි - සුසුම් හෙළා හඬා වැටෙමි

නිරතුරු ඔබෙ මුහුණ දකිමි - පෙම් සටනින් පැරද නොයමි
ලොවක් නොමැත අපට අහිමි - ඔබ හා මිස තනි ව නොයමි"[107]



වසත් විරිත ඇසුරින් ම රචනා වූ ගීත කිහිපයක් වශයෙන් මර්සලින් ජයකොඩි පියතුමා රචනා කළ "අහසේ තරු එළි" නම්" ගීය[108], අරිසෙන් අහුබුදු රචනා කළ "ටිකිරි ටිකිරි ටිකිරි ලියා"නම් ගීය.[109], ප්‍රේමකීර්ති ද අල්විස් රචනා කළ "මලක් වෙන්න" නම් ගීය[110], රඹුකන සිද්ධාර්ථ හිමි රචනා කළ "සිංහපුරෙන් මෙහි ආවෝ"[111], "කිරට හඬන කිරි දරුවෝ"[112], "සිනා නඟන මල් කැකුළු"[113] මහගම සේකර "ආදරයයි කරුණාවයි" චිත්‍රපටයට රචනා කළ "ඔන්න බබෝ ඇතින්නියා" නම් ගීය[114], ප්‍රේමකීර්ති ද අල්විස් "අබිරහස" චිත්‍රපටයට රචනා කළ "චන්දන ඇල්ලෙන් නාලා" නම් ගීය[115] ආදිය දැක්වීමට පුළුවන.

***උතු ඡන්දසට*** අයත් ***යොන්මත්වැල විරිතෙහි*** දී පාදයකට මාත්‍රා දහයකින් පර ව ගුරු අක්ෂරයක් බැගින් යෙදෙන බවත් ***උවදෑ විරිතෙහි*** දී පාදයක් මාත්‍රා දහයක් හා ගුරක් බැගින් යෙදෙන බවත් එළුසඳස්ලකුණ පවසයි. "මිණි මොර මී පිරුණු පතා - අතෙක අතෙක හිගුරු සැතා.......", "මේ කුම් නම් වේ උපැතී - කඳ කලු පලු මේ රුවැතී......." යනාදි වශයෙන් පිළිවෙළින් මෙම විරිත් දෙක සඳහා එළුසඳස්ලකුණ දක්වා ඇති නිදර්ශන පද්‍ය ආශ්‍රයෙන් හෝ මේවායේ වෙනස පැහැදිලි කර ගත හැකි නොවෙතත් යොන්මත්වැල විරිතෙහි දී ගුරු අක්ෂරය කාව්‍යයේ අගට ම යෙදිය යුතු බවත් උවදෑ විරිතෙහි දී එය වෙනත් තැනෙකට වුව ද යෙදීමට හැකි බවත් එළුසඳස්ලකුණේ එන විග්‍රහය විශ්ලේෂණය කර බැලීමේ දී හැඟෙයි. ඒ අනුව යොන්මත්වැල විරිත යෙදී ඇති ප්‍රබන්ධ රාශියක් නූතන ගීත රචනා අතර දැක ගත හැකි වේ. රඹුකන සිද්ධාර්ථ හිමි රචනා කළ "සඳ තරු මල්" නම් ගීය රචනා වී ඇත්තේ ද යොන්මත්වැල විරිත මුල් කොට ගනිමිනි.

"සඳ තරු මල් මට දන් දුන් - මගේ රුසිරු නුඹ අර ගන්
හිරු තෙද වන් මට දන් දුන් - මගේ ඔටුණු නුඹ ලා ගන්

ගණ දෙවිඳුන් මට දන් දුන් - මගේ නුවණ නුඹ අර ගන්
පතිනි මවුන් මට රැක දුන් - පතිනි බලය නුඹ අර ගන්''[116]

"රටෙන් අඩක් බඩගින්නේ"[117], "බුදුරුව සේ හිත නිවෙනා"[118], "

පෙර කළ පව් ද එකතු වී"[119] වැනි ගීවල දී ද උන්වහන්සේ එම විරිත ඇසුරු කොට ගෙන තිබේ.

***සෙල් ඡන්දසට*** අයත් ***මිණිමල් විරිත*** ද නූතන ගීත ප්‍රබන්ධ අතර සුලබ වශයෙන් විද්‍යමාන වන්නකි. එළුසඳස්ලකුණ පාදයක් මාත්‍රා 14ක් වන සේ බැඳි මාත්‍රා අටකින් සහ සයකින් පර ව යති තැබෙන විරිත එනමින් හඳුන්වා තිබේ. රඹුකන සිද්ධාර්ථ හිමි රචනා කළ "සැරියුත් මුගලන් පරම්පරාවේ"[120], "සුවදායක මහමෙව්නාවේ"[121], "රන්කිර සොයමින්"[122] වැනි ගීවල එම විරිත යෙදී තිබේ. සු නි ල් ආරියරත්න රචනා කළ "යුහුසුලුවන්"[123] නම් ගීතය රචනා වී ඇත්තේ ද මිණිමල් විරිත ආශ්‍රය කොට ගනිමිනි. අරිසෙන් අහුබුදු "රන් දෙවොලින් බැසැ එන් දෙයියෝ" නම් ගීයේ දී මිණිමල් විරිත අනුගමනය කොට ඇති අවස්ථාවක් මෙසේ ය.

"වලාකුළෙන් මතු වන දෙයියෝ-සත් පියුමන් පිට යන දෙයියෝ
රන් දෙවොලෙන් බැසැ එන දෙයියෝ-අපේ හදට වැඩැපන් දෙයියෝ"[124]

දයානන්ද ගුණවර්ධන "බක්මහ දීගේ" චිත්‍රපටයට රචනා කළ "ආදර හැඟුම්" නම් ගීයේ අන්තරා කොටස් ද මිණිමල් විරිතට අනුගත ය.

"කිම ද ඔබ මල් කුමරියන්නේ-පෙති විදා සතුටින් නොඉන්නේ
රහස නැති ව ද මං නොදන්නේ-තුරුලෙ බඹරුන් නොවෙද ඉන්නේ"[125]

***ගජ ඡන්දසට*** අයත් විරිත් අතුරින් නූතන ගීත රචනාවන්හි සුලබ ව දක්නට ලැබෙන්නේ ***පෙද විරිතයි***. පාදයක් මාත්‍රා දහසයක් වන සේ මාත්‍රා සතරින් සතරට යති තැබෙනුයේ පෙද විරිත (පදක වෘත්තය) නම් වේ. මඩවල ඇස්. රත්නායක රචනා කළ "මේ තුන් සරණයි", "දෑස විවර වී", "ලොව ගිනි ගනී" යන ගී ද රචනා වී ඇත්තේ පදක විරිතෙනි.[126] ධර්මසිරි ගමගේ රචනා කළ "හද විල කළඹන පෙම් ජල රේඛා" නම් ගීය ද පදක වෘත්තයට අනුව රචනා වී තිබේ.

"හද විල කළඹන පෙම් ජල රේඛා - ඒ විල මැද සීතල සඳ රේඛා
දෑසෙහි තවරා ආදර රේඛා - ඔබ රුව සිහිනෙන් හද ඇඳි රේඛා

වරලස අක්බඹරුන් රැඳි රේඛා - දෙනෙතෙහි ආදර හසරැලි රේඛා
දෙතොලෙහි ආදර හසරැලි රේඛා - ඔබ රුව සිහිනෙන් හද ඇඳිරේඛා"[127]

මහගමසේකර "පරසතු මල්" චිත්‍රපටයට රචනා කළ "පරවුණු මල්වල සුවඳ අතීතේ"[128] නම් ගීය සේ ම "වෙසතුරු සිරිත" චිත්‍රපටයට රචනා කළ "වනේ පලාපල නැත පෙර ලෙසිනේ"[129] නම් ගීය ද පදක වෘත්තයට අනුගත ය. මර්සලින් ජයකොඩි පියතුමා රචනා



කළ "ලස්සන අම්මා,"[130] ප්‍රේමකීර්ති ද අල්විස් රචනා කළ "බානෙන් බැඳ රජ රට පෙදෙසින්නේ" යන ගී ලියැවී ඇත්තේ ද පෙද විරිතෙනි.

"බානෙන් බැඳ රජ රට පෙදෙසින්නේ-කෝච්චියේ හිර ගෙයි ලැග ඉන්නේ
පිහියේ මුවහත ගෙල සිප ගන්නේ - උදයෙම මේ කය නිසසල වන්නේ"[131]

සමන් චන්ද්‍රනාත් වීරසිංහ රචනා කළ "ළබැඳි සබඳ ඔබ කිම ද තැවෙන්නේ"[132] නම් ගීතය ද අරිසෙන් අහුබුදු රචනා කළ "බුද්ධං සරණේ සිරස දරාලා"[133] නම් ගීතය ද පෙද විරිත අනුව ම ලියැවී ඇත.

***ගජ ඡන්දසට*** අයත් ***දෙව්ගාහ විරිත*** ස'ගණයකින් පර ව මාත්‍රා සතරක් යෙදී එතැන යතිය ද පිහිටුවා යළි න, ය යන ගණ ද යෙදීමෙන් සකස් වෙයි. රඹුකන සිද්ධාර්ථ හිමි රචනා කළ "සසර දනව්වේ" නම් ගීයේ දෙවන අන්තරා කොටස දෙව්ගාහ විරිතේ ඇතැම් ලක්ෂණ ප්‍රකට කරනු දැක ගත හැකි ය. සගණයකින් පර ව මාත්‍රා සතරක් යෙදී එළිසමය තැබීමේ ලක්ෂණයත් පාදයක් මාත්‍රා 16ක් වීමේ ලක්ෂණයත් හැර සෙසු ලක්ෂණ එහි ඒ ආකාරයෙන් ම යෙදී නැතත් පාදන්තයේ ගුරු අක්ෂරයක් ද යෙදී ඇති බැවින් ඉන් දෙව්ගාහ විරිතට සමාන රිද්මයක් නැංවෙන ආකාරය "පැවසූ සදහම්, තිගුණ කරාහා - විනෙයා කුමුදන්, සිසිර කරාහා..." යන එළුසඳස්ලකුණ දැක්වූ නිදර්ශන පද්‍යය හා සසඳා බැලීමෙන් පැහැදිලි වේ.

"මලකින් මලකට පාවෙන සුවඳයි-සවනින් සවනට යාවෙන මිහිරයි
පහනින් පහනට දැල්වෙන එළියයි-අඳුරෙන් එළියට යන මිණි පහනයි"[134]

***රැඳි ඡන්දසට*** අයත් විරිත් අතුරින් ***සමුදුරුගොස් විරිත*** නූතන කාව්‍ය-ගීත නිර්මාණවල සුලබ ව දක්නට ලැබෙන්නකි. පාදයකට මාත්‍රා දහඅටක් වන සේ ද මාත්‍රා දහයකින් පර ව යතිය තැබෙන සේ ද බැඳි විරිත එනමි. සුනිල් ආරියරත්න රචනා කළ "අයියණ්ඩියෙ පොඩි දා සිට,"[135] "විලක් උනත් නිල් දිය පිරි විලක් නොවේ,"[136] "පෙර රජ දවස වැව් දාගැබ් ගණන් කොට,"[137] "සුදු හාමිනේ නුඹ කොතැනද අද දවසේ,"[138] "පානංපත්තුවේ ඩිංගිරි අම්මා,"[139] "නීතිය" (සීතල පොළොව ම සිරි යහනක් වේවා),[140] "සුභාෂිත හෙවත් හිතෝපදේශ" (බමුණා වුණත් දුදනකු නම් බිම හොවනු),[141] "කවදා පායත් ද අප දිනිසුරාණෝ,"[142] "රීරි විලේ බැස කෙළිමින් නාපු යකා,"[143] "ලොව ම දිනමු,"[144] "ආල හැඟුම්,"[145] "හුදෙකලාව,"[146] "උදා වර්ණනා,"[147] "අවසන් හුස්ම පොද,"[148] "සිංහලකම"[149] යන ගීත සියල්ල

ම සමුදුරු ගොස් විරිතට අනුව ප්‍රබන්ධිත ය. අජන්තා රණසිංහ රචනා කළ "නන්නාඳුනන උදවිය සේ අක්කේ,"[150] රත්න ශ්‍රී විජේසිංහ රචනා කළ "භූමාටු දේවතාවිය,"[151] "ගෝමරියේ,"[152] රඹුකන සිද්ධාර්ථ හිමි රචනා කළ "මලේ සුවඳ වාගේ මල මත ම රැඳී,"[153] "මිය ගිය පුතුන් වෙනුවෙන් දුක් කඳුළු බොන,"[154] "වසන්තයට පෙම් මල් පීදිලා වගේ,"[155] "ලේ කිරි කර පෙවූ මැණියනේ ඔබට,"[156] "මලේ සුවඳ වාගේ මල මත ම රැඳී,"[157] "ඉරට නොවේ දුක ඉර රළු වැඩි හින්දා,"[158] අරිසෙන් අහුබුදු රචනා කළ "පව් කළ දැයක ඉපදීමයි පව ලොකු ම" යන ගීත සියල්ල ද ඊට අනුගත ය.

"පව් කළ දැයක ඉපැදීමයි පව ලොකු ම
හෙළ දැය වුවමනා නැහැ හෙළයා හට ම
පරයන් රජ කරනු දැකැ දැකැ හිස මතැ ම
ඇහැ කන පියා හිඳුමයි අද හෙළ දහම"[159]

***රවුළු ඡන්දසට*** අයත් ***නරඟරඟ විරිත*** පාදයක් මාත්‍රා දහනවයක් වන සේ ද මාත්‍රා නවයෙන් හා දහයෙන් යති තැබෙන සේ ද ප්‍රබන්ධය කෙරෙන්නකි. සුනිල් ආරියරත්න රචනා කළ " දෙස-බස-රැසට එරෙහි ව" නම් ගීයේ අන්තරා කොටස්වල අවසන් පාද හැර සෙසු පාද නරඟරඟ විරිතට අනුකූල ව ලියැවී තිබේ.

"පරයින් බසට ගැති සිහලුන් පිටු දකිනූ
පරයින් පා සිඹින වහලුන් දුරු කරනූ
පරයින් මිතුරු කැළ සතුරන් ලෙස සිතනූ
පරයින් නසන නිදහස් පිළිරැව් නඟනූ"[160]

***රවුළු ඡන්දසට*** අයත් ***වියන් විරිතෙහි*** පාදයක් මාත්‍රා 20ක් බැගින් යෙදේ. එය ද නූතන ගීත හා කාව්‍ය නිර්මාණ අතර බහුල වශයෙන් යොදා ගැනෙන විරිතකි. සුනිල් සරත් පෙරේරා රචනා කළ "හෙදිය" නම් ගීතය රචනා වී ඇත්තේ එම විරිතෙනි.

"සිනහ නඟන්නී ලැසි ලැසි ගමනින් එන්නී
ඔමරි කරන්නී ඇඳ වට කැරකී යන්නී
විදුලිය වැන්නී කෙදිරිල්ලට දිවැ එන්නී
කිංකිණි හඬිනී ගිලනුන් සනසා ලන්නී"[161]

මර්සලින් ජයකොඩි පියතුමා රචනා කළ "නත්තල් පඬුරු,"[162] ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ රචනා කළ "වසන්ත ගීතය,"[163] තිලකරත්න කුරුවිට බණ්ඩාර "සරුංගලය" චිත්‍රපටය සඳහා රචනා කළ "ඉසුරු



දෙවිඳු උමයංගන සේ පෑහෙන්නයි,"[164] රඹුකන සිද්ධාර්ථ හිමි රචනා කළ "කාලිංග යුද බිමේ මිනිස් ලේ ගලාලා,"[165] "වීර ගැමුණු ජය මාවත දෑස දකින්නයි," "ගමට ගියත් දුවේ කියන හඬ ඇහෙන්නෙ නෑ"[166] යන ගී ද වියන් විරිත ඇසුරු කොට ගනිමින් රචනා වී තිබේ. අරිසෙන් අහුබුදු "සන්දේසය" චිත්‍රපටය සඳහා රචනා කළ "කටේ කිරි සුවඳ යන්නට පවා බැරි වුණා" නම් ගීයේ දී ද යොදා ගෙන ඇත්තේ වියන් විරිතයි.

"කටේ කිරි සුවඳ යන්නට පවා බැරි වුණා
යුදට උපන් කුමරිඳු යැයි නමක් ඇති වුණා
මුල්ලෙරියා වෙලෙහි වතුර ලෙයට හැරැ වුණා
ටිකිරි කුමරු රාජසිංහ නමින් රජ වුණා"[167]

***රවුළු ඡන්දසට*** අයත් ***නලහව් විරිතෙහි*** ලක්ෂණ වශයෙන් එළුසඳස්ලකුණ පෙන්වා දී ඇත්තේ, පාදයක් මාත්‍රා 20ක් වන සේ, මාත්‍රා නවයකින් යති තැබීම හා අවසන්හි ය'ගණය යෙදීමයි. සුනිල් ආරියරත්න රචනා කළ "සුළං කපොල්ලේ" නම් ගීතයේ දෙවන අන්තරා කොටස රචනා වී ඇත්තේ නලහව් විරිතට අනුව ය.

"ඇයට මවක් පියෙක් නොමැත සිතිජ වළල්ලේ
කඳුළ පමණි ඇයට උරුම දවස මුළුල්ලේ
ඔබ තනිකඩ කුරුලු රජෙකි වෙසෙන නිදැල්ලේ
ඇයට ලැගුම් දෙන්න සබඳ ඔබේ කැදැල්ලේ"[168]

***තෙනෙත් ඡන්දසට*** අයත් ***සෝදැමිනී විරිතෙහි*** පාදයක් මාත්‍රා 22ක් වන සේ අවසානයට ය'ගණයක් යෙදේ. අජන්තා රණසිංහ රචනා කළ "මල් පොකුරු පොකුරු" නම් ගීයේ අන්තරා කොටස් එම විරිතට අනුව රචිත ය.

"නිල්ල නිලන ගහ කොළ මත පින්න පිපීලා
ඇගෙ පුංචි ටිකිරි පා වටකොට රංචු ගැසීලා
පින්න පිපීලා ඈ ළඟ රංචු ගැහීලා
ඇගෙ පුංචි ටිකිරි පා වටකොට රංචු ගැහීලා"[169]

***තෙනෙත් ඡන්දසට*** අයත් ***දිගෝවිලි විරිත*** ද නූතන ගීත හා කාව්‍ය නිර්මාණ අතර සුලබ ව දක්නට ලැබෙන්නකි. දිගෝවිලි නම් වනුයේ පාදයක් මාත්‍රා 22ක් වනු විනා වෙනත් ලඝු-ගුරු නියමයකින් තොර වූ විරිතයි. රඹුකන සිද්ධාර්ථ හිමි රචනා කළ "කඳුළු හෙළා නැඹිලියට" නම් ගීයේ ස්ථායි කොටස දිගෝවිලි විරිතට අනුව රචනා වී ඇත.

"කඳුළු හෙළා නැඹිලියට සහල් ගරන අම්මා
සුසුම් හෙලා ගිනි දළු ගෙන ළිප මොළවන අම්මා
වෙල් දෙණිවල ඇවිද ගොසින් වෙරළු ගෙනැත් අම්මා
ඉණිවැට ළඟ බලා හිඳී අප එනතුරු අම්මා"[170]

සුනිල් ආරියරත්න රචනා කළ "හිතමිතුරු සුළඟ"[171] නම් ගීතයේ ස්ථායී කොටස හා "ධර්මාධිකරණය" (මැගේ නම ලංකා ය),[172] "විරහිනී"[173] යන ගීතවල අන්තරා කොටස් එම විරිතට අනුගත ය. කරුණාරත්න අබේසේකර "චණ්ඩියා" චිත්‍රපටයට රචනා කළ "මග හිඟන කොටත් උණු උණු බත් කන්න ලැබෙනවා"[174] නම් ගීය දිගෝවිලි විරිතට අනුව ම රචනා වී තිබේ.

***හිරු ඡන්දසෙහි*** එන එක ම විරිත වන ***දිගහුරු විරිත*** සකස් වනුයේ මාත්‍රා අට, සය, නවය යන තැන්වල විරාමය තැබෙන සේ මාත්‍රා 23කින් යුක්ත වන පාද යොදා ගැනීමෙනි. රත්න ශ්‍රී විජේසිංහ රචනා කළ "දුරස්ත" නම් ගීයේ අන්තරා කොටස්වල පාදාන්තාක්ෂර දීර්ඝත්වයෙන් ගත් විට දිගහුරු විරිත ලැබේ.

"මා මුහුදු තෙරේ තනිකොට ඔබ ඈත හිනා වෙයි
නෙතු දැල වරින් තරඟ රැඟුම් ගලා ගලා එයි
මා පොළෝ ගැබේ පුංචි තිතක් බවට හැරී යයි
ඔබ නීල නුවන් අහස සරා සඳට සිනාසෙයි"[175]

සුනිල් සරත් පෙරේරා රචනා කළ "සමනොල අඩවිය" නම් ගීයේ ස්ථායි කොටස ද දිගහුරු විරිතට අනුව ලියැවී තිබෙනු දැක ගත හැකි ය.

"සමනොළ සිරිපා වඳිනට - යන සමනල පේළියයි
නිල් වන් කඳු ගැට පිස එන-සුදු මිහිදුම් සේලයයි"[176]

***මී ඡන්දසට*** අයත් ***නුපුන්සඳ විරිත*** සැකසෙන්නේ මාත්‍රා 18කින් පර ව ගුරු දෙකක් යෙදී යතිය තැබීමෙන් ඉක්බිති ව නැවත ගුරු දෙකක් යෙදීමෙනි. ඒ අනුව එහි පාදයකට මාත්‍රා 26කි. යමුනා මාලිනී පෙරේරා රචනා කළ "වැටහීම" නම් ගීයේ පළමු ස්ථායි කොටස ආරම්භයේ නුපුන් සඳ විරිත යෙදී තිබේ.

"වෙල් ඉපනැල්ලේ සිත් සැනසිල්ලේ දුව පැන්නා බාලේ
ඇල දොළ වැල්ලේ පැනැ ගඟුලැල්ලේ අප උන් ඒ කාලේ"[177]



***මදු ඡන්දසට*** අයත් ***පුණුඅතිපුණු විරිත*** ද නූතන කාව්‍ය - ගීත නිර්මාණ අතර බහුල ව යොදා ගැනෙන්නකි. පුණුඅතිපුණු යනු පාදයක් මාත්‍රා විසි අටක් වන විරිතයි. අරිසෙන් අහුබුදු රචනා කළ "සාදු සම්මා සම්බුදුන්නේ"[178] නම් ගීය රචනා වී ඇත්තේ පුණුඅතිපුණු විරිතෙනි. සුනිල් ආරියරත්න රචනා කළ "තුන් හෙළේ කැලෑ තුළ සිංහ පැටව්"[179] යන ගීය පාද එක් කොට ලියා දැක්වූ කල පුණුඅතිපුණු විරිතට අයත් කළ හැකි වන බව පෙනේ.

අජන්තා රණසිංහ රචනා කළ "ඉගිල්ලිලා යන්න යං" නම් ගීයේ අන්තරා කොටස් පුණුඅතිපුණු විරිතට අනුව රචනා වී ඇත්තේ මෙසේ ය.

"ඉරු දේවයා වැඩියොත් තමා බොල් පිණිකැට සැඟවී යන්නේ
සඳ දේවයා වැඩියොත් තමා ගන අඳුරේ පාළුව මැකුණේ
රජ මාලිගේ පොඩි පැල්පතේ මිනිසුන්මය ඉපදී ඉන්නේ
ඒ කාරණා නොදැනී මෙදා ඇයි නොමිනිස් කම් මතු වන්නේ"[180]

පාදයක් මාත්‍රා විසි අට ඉක්මවන විරිත් *දඬු* (දණ්ඩක වෘත්ත) නම් වේ. මාත්‍රා 30, 32, 34, 36 ආදි වශයෙන් දණ්ඩක විරිත් විකාසනය වේ. මර්සිලීන් ජයකොඩි පියතුමා රචනා කළ "ළඳක් පමණි මා,"[181] "මුතු ඇට බෙදන්න බෑ"[182] යන ගී රචනා වී ඇත්තේ පාදයක් මාත්‍රා 30ක් වන දණ්ඩක විරිත ඇසුරු කොට ගනිමිනි. අජන්තා රණසිංහ රචනා කළ "වනාන්තරේ මහ රුස්ස ගහකොළ" යන ගීය ද පාදයක් මාත්‍රා 30ක් වන දණ්ඩක විරිතෙන් ලියැවුණු පද්‍ය තුනකින් යුක්ත වෙයි.

"වනන්තරේ මහ රුස්ස ගහකොළ බිමට සමතලා කර අම්මේ
රාස්සයින් වැනි යන්ත්‍ර සූත්තර මහ සද්දෙන් යනවා අම්මේ
සිමෙන්ති කලුගල් ලොරි පිට පටවා වේල්ල බඳිනා හැටි අම්මේ
බලාන ඉන්නට උඹ වත් දවසක එක්කර ගෙන එන්නම් අම්මේ"[183]

ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ රචනා කළ "නිදි කුමරිය" නම් ගීය ද පාදයක් මාත්‍රා 32ක් වන දණ්ඩක විරිත ඇසුරු කොට ගනිමින් විරචිත ය.[184] විමල් අභයසුන්දර රචනා කළ "සඳුට උඩින්" නම් ගීය රචනා වී ඇත්තේ පාදයක් මාත්‍රා 40ක් වන දණ්ඩක විරිත ඇසුරු කොට ගනිමිනි.

"සඳුට උඩින් සඳු ගල ගල් පා මුල අලුත් හේන් පැහිලා
කරල් බර අලුත් හේන් කපලා
හිරුට උඩින් ඉරු ගල ගල් පාමුල නව කිරි බත පිසලා
කිරෙන් එළ රස මසවුළු පිසලා
මෙරට උඩින් මෙරගල ගල් පාමුල තෙල් ද නානු තනලා
නහන්නට ඇළ දොළ ළිං පිරිලා
හැඩට හැඩින් පට සළු රන් දුකුල අලුත් ඇඳුම් මහලා
රුවන් මිණි මලින් ඇඳුම් මහලා"[185]

ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ රචනා කළ "සේපාලිකා" නම් ගීත නාටකය අවසානයේ එන පහත දැක්වෙන සමූහ ගායනයේ පාදයක් මාත්‍රා 48ක් වන දණ්ඩක විරිත උපයුක්ත කොට ගෙන තිබේ.

"සිනා කටයි මල් දෙමිටයි සූකිරි කන ටිකිරි කටයි
කොමළ බඳයි මල් වඩමයි පොඩි සේපාලිකා නටයි
සමනලයයි මී මැස්සයි කුමරි වටේ අහසෙ නටයි
සුදු මිදුලයි පිට්ටනියයි දෙක ම එක ම මල් යහනයි

මඳ පවනයි සුබ උදයයි ජීවිතයට රස මිහිරයි
රුවට රුවයි සුරු බුහුටියි පාන්දර ම මිදුලෙ නටයි
තන තන තම් තාන තනම් තනෙන තනෙන තනෙන තනා
කොමළ බඳයි මල් වඩමයි පොඩි සේපාලිකා නටයි"[186]

## දෙ පා

එළුසඳස්ලකුණේ සිව්පදවලින් ඉක්බිති ව විග්‍රහ වනුයේ පාද දෙකක් ඇති විරිත් පිළිබඳ ව ය. ඒ අනුව දෙපා යනු සිව්පදයකින් අර්ධයකි.[187] එහි දෙව්පාණී, මුනිනඳන පෙරවිලඹු, මුනිනඳන පරවිලඹු, පිහියොඹු යන දෙපා විරිත් විග්‍රහ කොට තිබේ.

දෙව්පාණී යනු පළමු පාදය ත'ගණය, ස'ගණය, ගුරු දෙකක්, ත'ගණය, ස'ගණය, ගුරක් වන ලෙසින් ද, දෙවන පාදය ත'ගණය, බ'ගණය, ගුරක්, ස'ගණය, බ'ගණය, ගුරක් වන ලෙසින් ද යෙදෙන සේ පාද දෙකෙහි එකිනෙකට වෙනස් වූ එළිසම දැක්වෙන්නා වූ විරිතයි."[188] පළමු පාදය දෙවන පාදයට වඩා දීර්ඝ වන විරිත මුනිනඳන පෙරවිලඹු[189] නමින් ද දෙවන පාදය පළමු පාදයට වඩා දීර්ඝ වන විරිත මුනිනඳන පරවිලඹු[190] නමින් ද හඳුන්වා තිබේ. ඒ අනුව මුනිනඳන පරවිලඹු විරිත, මුනිනඳන පෙරවිලඹු විරිතෙහි ම විපර්යාසය බව පෙනේ. මෙම විරිත් දෙකෙහි ම මාත්‍රා අගයක් පිළිබඳ ව සඳහන් නොවන බැවින් මේවායේ භේද සංඛ්‍යාව අප්‍රමාණය. පිහියොඹු නමින්



සඳස්ලකුණු කරුවා දක්වා ඇත්තේ අවසන් අක්ෂරය දීර්ඝ නොවූ, එළිසම සහිත දෙපෙළෙකින් යුක්ත විරිතයි.[191]

එළුසඳස්ලකුණ කතුවරයා ***මුනිනඳන පෙරවිලඹු*** නමින් දක්වා ඇති පළමු පාදය දෙවන පාදයට වඩා දීර්ඝ වන දෙපා විරිත රඹුකන සිද්ධාර්ථ හිමි රචනා කළ "ශාන්ති දායක ශාන්ති නායක" නම් ගීතයේ යෙදී තිබේ. එහි පළමු පෙළ මාත්‍රා 31ක් ද දෙවන පෙළ 28ක් ද වේ.

"ශාන්තිදායක ශාන්තිනායක ශාන්තිවාදී බුදු පියාණන්
දෙසූ සදහම් මහිම රැව් දුන් මගේ මව් බිම වාසනාවන්"[192]

ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ රචනා කළ "මනෝහාරි" ගීත නාටකයේ එන පහත පරිද්දෙන් ඇරඹෙන අත්වැල් ගායනය මුනිනඳන පෙරවිලඹු විරිතෙන් රචනා වී ඇත. එහි පළමු පෙළ මාත්‍රා 20ක් ද දෙවන පෙළ 15ක් ද වන සේ යෙදී ඇත.

"දැන් යමවු දැන් යමවු එක් වෙයවු රැස් වෙයවු
තෙද බලේ ලේවලින් පණ පොවවු..."[193]

සුනිල් ආරියරත්න "මං මුළා වී පාර සොයා ගෙන" යන ගීතයේ ස්ථායි කොටස රචනා කොට ඇත්තේ මුනිනඳන පෙරවිලඹු විරිත ආශ්‍රය කොට ගනිමිනි. එහි පළමු පාදය මාත්‍රා 29ක් ද දෙවන පාදය මාත්‍රා 25ක් ද වන පරිදි යෙදී ඇත.

"මං මුළා වී පාර සොයා ගෙන හසරක් අසමින් යන ගමනේ
මං මුළා වූ සමනලියකගෙනි පාර අසා තිබුණේ"[194]

එළුසඳස්ලකුණ ***මුනිනඳන පරවිලඹු*** නමින් දක්වා ඇති දෙවන පාදය පළමු පාදයට වඩා දීර්ඝ වන දෙපා විරිත රඹුකන සිද්ධාර්ථ හිමි රචනා කළ "පාවෙන වලා අතර" නම් ගීතයේ අන්තරා කොටස්වල යෙදී තිබේ. එම ගීත ඛණ්ඩවල පළමු පාදය මාත්‍රා 16 බැගින් ද දෙවන පාදය 18 බැගින් ද යෙදී ඇත.

"රමණීයයි මේ මධුර ජවනිකා
වනපෙත එකළු කරයි කුරුලු ගීතිකා..."[195]

අරිසෙන් අහුබුදු රචනා කළ "සැරදේ බක් මාසේ" නම් ගීයේ පළමු ගීත ඛණ්ඩය හැරුණු කල සෙසු සියලු කොටස් මුනිනඳන පරවිලඹු විරිතෙන් රචනා වී තිබේ. ඒවායෙහි පළමු පාදය මාත්‍රා 26 බැගින් සහ දෙවන පාදය මාත්‍රා 28 බැගින් යෙදී තිබේ.

"බමරුන් පිස්සු වැටිලා මල් ගස් සිඹ සිඹ යන මාසේ
පල බර ගස් වැල් දන්සැල් සරසා සියොතුන් කැඳවන මාසේ..."[196]

අරිසෙන් අහුබුදු රචනා කළ "පැරකුම් සයුරේ රළ පෙළ පෙරළේ" නම් ගීයේ ආරම්භක ගීත ඛණ්ඩය රචනා වී ඇත්තේ මුනි නඳන පරවිලඹු දෙපද ගීයක් ලෙසිනි. එහි ප්‍රථම පාදය මාත්‍රා 28ක් ද දෙවන පාදය මාත්‍රා 30ක් ද වනු දැක ගත හැකි ය.

"පැරකුම් සයුරේ රළ පෙළ රඟ දේ රැළි දේ, සුළි දේ, විහිදේ
ඈත අතීතේ මහිමේ සිහි වේ සිංහලයා පිබිදේ, පිබිදේ"[197]

එළුසඳස්ලකුණ ***පිහියොඹු*** නමින් දක්වා ඇති අවසන් අක්ෂරය දීර්ඝ නොවූ, එළිසම සහිත දෙපෙළකින් යුක්ත දෙපා විරිත ද සිංහලගේය කාව්‍යයන්හි දක්නට ලැබෙන්නකි. නිලාර් එන්. කාසිම් රචනා කළ "නෑකම" නම් ගීයේ අන්තරා කොටස් ඒ සඳහා නිදර්ශනත්වයෙන් දැක්වීමට පිළිවන.

"තල් අරණේ ගිනි නිවන්න
සිනා වතක් මටත් දෙන්න
සිනාවකට මඟ කියන්න
එන්න කඳුළු බෙදා ගන්න..."[198]

නූතනගේය කාව්‍ය රචකයන් එළුසඳස්ලකුණේ දැක්වෙන ගී, සිව්පද හා දෙපා විරිත්වලට සමාන වූ ඡන්දස් ලක්ෂණ උපයුක්ත කොට ගෙන ඇති ආකාරය මෙහි දී තුලනාත්මක ව අධ්‍යයනය කෙරිණි. ප්‍රස්තුත ගීත නිබන්ධකයන් එම ලක්ෂණ ගැඹුරින් අධ්‍යයනය කොට ඒවා පිළිබඳ අවබෝධයකින් යුතු ව එකී සෑම අවස්ථාවක දී ම ගීත ප්‍රබන්ධය කර ඇතැ'යි කිව හැකි නොවෙතත් සාම්ප්‍රදායික සිංහල ඡන්දස් ව්‍යාපාරයට අනුරූප වූ වෘත්ත ලක්ෂණ වර්තමානයේ පවා ඒ ඒ ගීත නිබන්ධකයන්ගේ අර්ථය හා රසය තීව්‍ර කෙරෙන සේ යෙදී ඇති ආකාරය මෙමගින් පැහැදිලි කොට ගත හැකි වේ.

කවීන්ගේ ආකෘති හා රිද්ම රටා අතර පොදු භාවයක් පවතී. එක හා සමාන වූ ආකෘති ජනකවියේත්, වියත් කවියේත්, විදේශීය කාව්‍ය-ගීතාදියේත්, නූතන ගීතවලත් දක්නට ලැබෙන්නේ ඒ හේතුවෙනි. එබැවින් ඡන්දස් ලක්ෂණ අමුතුවෙන් හැදෑරුයේ නැතත් එවන් වූ ව්‍යවහාරයන් පිළිබඳ අවබෝධයෙන් පසු වන කවියාගේ නිර්මාණවල ඒවාට සමාන වූ ආකෘති අනුත්සාහක ව ම යෙදෙන්නට



පිළිවන. එසේ ම තවත් විටෙක ඡන්දස් කෘති ආදිය අධ්‍යයනයෙන් ලබා ගන්නා වූ ශික්ෂණය ද තම නිර්මාණ සඳහා විවිධාකාරයෙන් උපකාරී විය හැකි ය. මේ දෙයාකාරයෙන් ම නූතන ගීත රචකයන්ගේ නිර්මාණවලට එළුසඳසට සමාන වූ ගී, සිව්පද හා දෙපා ලක්ෂණ බලපාන්නට ඇත. එහෙත් සමස්තයක් වශයෙන් ගත් කල එකී ලක්ෂණ පිළිබඳ සඳස්ලකුණුකරුවාගේ විග්‍රහය අද්‍යතන ගීත ප්‍රබන්ධ ආදියේ දී පවා පිටිවහල් කොට ගත හැකි ආකාරයත්, තවත් අතෙකින් එකී ලක්ෂණ සම්බන්ධ ව සඳස්ලකුණ කතුවරයා ඉදිරිපත් කරන්නා වූ සිද්ධාන්තවල පවත්නා ප්‍රායෝගිකත්වයත් මේ ආකාරයෙන් පසක් කොට ගත හැකි වේ.

**ආන්තික සටහන්:**

1 සියබස්ලකර, ලේල්වල ශ්‍රී සද්ධර්මාචාර්ය සිරිනිවාස හිමි, බෙන්තර ධර්මසේන ස්ථවිර, පණ්ඩිත හැගොඩ ධම්මින්ද ස්ථවිර සංස්කරණය ගොඩගේ, කොළඹ, 2002, 15 ගීය.
2 සි. ල., 16-18 ගී.
3 එලුසඳස්ලකුණ, වැලිවිටියේ සෝරත හිමි සංස්කරණය, සමයවර්ධන, කොළඹ, 2004, පි. 93.
4 "මතෙක් ලුහු ගුරු වේ - දෙමත් දිගු හා පසු හල්
ගුරු වක් කොටින් අඳනේ - ලුහු ඉඳු අඳු ඇඳමේ" එලු. ස., 02 ගීය.
5 "මන තුන් තුන් ගුරු ලුහු - බදස ඈ මැද කෙළෙ ගුරු
යරතෑ මැද වසන් ලුහු - අට ගණ මෙසේ දන්නේ" එලු. ස., 06 ගීය.
6 එම, 06 ගීය.
7 එම, 28 ගීය.
8 එම, 8 ගීය සහ පි. 13.
9 එම, 9 ගීය සහ පි. 15.
10 එම, 10 ගීය සහ පි. 16.
11 එම, 11 ගීය සහ පි. 16.
12 එම, 12 ගීය සහ පි. 16.
13 එම, 13 ගීය සහ පි. 16.
14 එම, 14 ගීය සහ පි. 17.
15 එම, 15 ගීය සහ පි. 18.
16 එම, 16 ගීය සහ පි. 18.
17 එම, 17 ගීය සහ පි. 18.
18 එම, 18 ගීය සහ පි. 19.
19 එම, 18 ගීය සහ පි. 19.
20 එම, 19 ගීය සහ පි. 20.
21 එම, 20, 21 ගී සහ පි. 20, 21.
22 එම, 22 ගීය සහ පි. 21.

23 එම, 23 ගීය සහ පි. 22.
24 එම, 24 ගීය සහ පි. 22.
25 එළුසඳස්ලකුණ, කරඳන පඤ්ඤානන්ද හිමි සංස්කරණය, 1938 (?).
26 එම, පි. 22.
27 "සත්‍යර්ථේ පෘථගර්ථයා ස්වරව්‍යඤ්ජනසංහතේඃ - ක්‍රමේණ තෙනෛවාවෘත්තිර් යමකං විනිගද්‍යතේ" - සාහිත්‍ය දර්පණ, බාබු භුවනචන්ද්‍ර වසාක සංස්කරණය, කල්කතා, 1869.10.640 (260 පිටුව).
28 හේරත්, සමන්ත සහ වෙත්තසිංහ, සමුද්‍ර, අජන්තා ගීතාවලී, ගොඩගේ, කොළඹ, 2002, පි. 270.
29 ආරියරත්න, සුනිල්, ළා හිරු දහසක්, දයාවංශ ජයකොඩි, (වර්ෂ රහිතයි), පි. 80.
30 හේරත්, සමන්ත සහ වෙත්තසිංහ, සමුද්‍ර, අජන්තා ගීතාවලී, ගොඩගේ, කොළඹ, 2002, පි. 144.
31 සිද්ධාර්ථ හිමි, රඹුකන, සසර දනව්ව, කොට්ටාව, 2006, පි. 93.
32 සම්පත්, බිහේෂ්, හද බැඳි පැදි, ගාල්ල, 2009, පි. 79.
33 එලු. ස., 29 ගීය.
34 එම, 36 ගීය සහ පි. 42.
35 එම, 37 ගීය සහ පි. 43.
36 එම, 37 ගීය සහ පි. 43.
37 එම, 38 ගීය සහ පි. 43.
38 එම, 38 ගීය සහ පි. 43.
39 එම, 39 ගීය සහ පි. 44.
40 එම, 39 ගීය සහ පි. 44.
41 එම, 40 ගීය සහ පි. 44.
42 එම, 41 ගීය සහ පි. 45.
43 එම, 41 ගීය සහ පි. 45.
44 එම, 42 ගීය සහ පි. 45.
45 එම, 42 ගීය සහ පි. 45.
46 එම, 43 ගීය සහ පි. 46.
47 එම, 43 ගීය සහ පි. 46.
48 එම, 44 ගීය සහ පි. 46.
49 එම, 44 ගීය සහ පි. 46.
50 එම, 45 ගීය සහ පි. 47.
51 එම, 45 ගීය සහ පි. 47.
52 එම, 46 ගීය සහ පි. 48.
53 එම, 47 ගීය සහ පි. 49.
54 එම, 48 ගීය සහ පි. 49.
55 එම, 49 ගීය සහ පි. 50.
56 එම, 50 ගීය සහ පි. 50.
57 එම, 51 ගීය සහ පි. 51.
58 එම, 52 ගීය සහ පි. 51.
59 එම, 53 ගීය සහ පි. 52.



60 එම, 54 ගීය සහ පි. 51.
61 එම, 55 ගීය සහ පි. 53.
62 එම, 55 ගීය සහ පි. 53.
63 එම, 56 ගීය සහ පි. 53.
64 එම, 57 ගීය සහ පි. 54.
65 එම, 58 ගීය සහ පි. 54.
66 එම, 59 ගීය සහ පි. 55.
67 එම, 60 ගීය සහ පි. 55.
68 එම, 61 ගීය සහ පි. 55.
69 එම, 62 ගීය සහ පි. 56.
70 එම, 63 ගීය සහ පි. 56.
71 එම, 64 ගීය සහ පි. 56, 57.
72 එම, 65 ගීය සහ පි. 57.
73 එම, 66 ගීය සහ පි. 57.
74 එම, 67 ගීය සහ පි. 58.
75 එම, 68 ගීය සහ පි. 58.
76 එම, 69 ගීය සහ පි. 58.
77 එම, 70 ගීය සහ පි. 59.
78 එම, 71 ගීය සහ පි. 59.
79 එම, 72 ගීය සහ පි. 60.
80 එම, 73 ගීය සහ පි. 60.
81 එම, 74 ගීය සහ පි. 61.
82 එම, 75 ගීය සහ පි. 61.
83 එම, 76 ගීය සහ පි. 62.
84 එම, 77 ගීය සහ පි. 62.
85 සිද්ධාර්ථ හිමි, රඹුකන, සසර දනව්ව, කොට්ටාව, 2006, පි. 33.
86 ආරියරත්න, සුනිල්, තුටු පඬුරු, ගොඩගේ, කොළඹ, 1994, පි. 96.
87 අහුබුදු, අරිසෙන්, අතු අගැ දිළි වන මල්, ගොඩගේ, කොළඹ, 1987, පි. 46, 47.
88 එම, පි. 46, 49.
89 එම, පි. 107.
90 ආරියරත්න, සුනිල්, නවාතැන්පොළ, ගොඩගේ, කොළඹ, 1999, පි. 49.
91 ආරියරත්න, සුනිල්, මානවසිංහ ගීත නිබන්ධ, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 1991, පි. 33.
92 කුඩලිගම, ගීතනාත්, සුළං කෝඩයක, තරංජී ප්‍රින්ටර්ස්, මහරගම, 1998, පි. 40.
93 ආරියරත්න, සුනිල්, ළා හිරු දහසක්, දයාවංශ ජයකොඩි, (වර්ෂ රහිතයි), පි. 56.
94 වීරසිංහ, සමන් චන්ද්‍රනාත්, අපේ කාලේ සරස්වතී, කොළඹ, 1990, පි. 83
95 එම, පි. 77.
96 අහුබුදු, අරිසෙන්, අතු අගැ දිළි වන මල්, ගොඩගේ, කොළඹ, 1987, පි. 78
97 එම, පි. 80.
98 පෙරේරා, යමුනා මාලිනී, ආදරය සුන්දර වරදකි, සාර ප්‍රකාශන, කොට්ටාව, 2000, පි. 06.

99 එම, පි. 34.
100 ආරියරත්න, සුනිල්, ළා හිරු දහසක්, දයාවංශ ජයකොඩි, (වර්ෂ රහිතයි), පි. 54.
101 එම, පි. 97.
102 අහුබුදු, අරිසෙන්, අතු අගැ දිළි වන මල්, ගොඩගේ, කොළඹ, 1987, පි. 100.
103 හේරත්, සමන්ත සහ වෙත්තසිංහ, සමුද්‍ර, අජන්තා ගීතාවලී, ගොඩගේ, කොළඹ, 2002, පි. 303.
104 ආරියරත්න, සුනිල්, නවාතැන්පොළ, ගොඩගේ, කොළඹ, 1999, පි. 46
105 එම, පි. 58.
106 ආරියරත්න, සුනිල්, ළා හිරු දහසක්, දයාවංශ ජයකොඩි, (වර්ෂ රහිතයි), පි. 20.
107 ආරියරත්න, සුනිල්, තනි යහනේ දී, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ, 1981, පි. 44.
108 ජයකොඩි පියතුමා, මර්සලින්, වෙසක් කැකුළු අතු අග හිඳ, දිවැස ප්‍රකාශකයෝ වැල්ලම්පිටිය, 1990, පි. 93.
109 අහුබුදු, අරිසෙන්, අතු අගැ දිළි වන මල්, ගොඩගේ, කොළඹ, 1987, පි. 41.
110 අල්විස්, ප්‍රේමකීර්ති ද, සිහින සතක්, ගොඩගේ, කොළඹ, 1998, පි. 68.
111 සිද්ධාර්ථ හිමි, රඹුකන, සංසාරේ අපි, කොට්ටාව, 2005, පි. 97.
112 එම, පි. 99.
113 එම, පි. 115.
114 හේරත්, සමන්ත, සිංහල චිත්‍රපට ගීත සාහිත්‍යය, ගොඩගේ, කොළඹ, 1995, පි. 206.
115 එම, පි. 243.
116 සිද්ධාර්ථ හිමි, රඹුකන, සසර දනව්ව, කොට්ටාව, 2006, පි. 67.
117 එම, පි. 72.
118 එම, පි. 79.
119 එම, පි. 150.
120 එම, පි. 71.
121 සිද්ධාර්ථ හිමි, රඹුකන, සංසාරේ අපි, කොට්ටාව, 2005, පි. 96.
122 සිද්ධාර්ථ හිමි, රඹුකන, සසර දනව්ව, කොට්ටාව, 2006, පි. 94.
123 ආරියරත්න, සුනිල්, නවාතැන්පොළ, ගොඩගේ, කොළඹ, 1999, පි. 83
124 එම, පි. 106.
125 හේරත්, සමන්ත, සිංහල චිත්‍රපට ගීත සාහිත්‍යය, ගොඩගේ, කොළඹ, 1995, පි. 240.
126 රත්නායක, මඩවල, ටිකිරි ලියා, ගොඩගේ, කොළඹ, 1992, පි. 70, 71, 78.
127 ගමගේ, ධර්මසිරි, සුළං කුරුල්ලෝ, ගොඩගේ, කොළඹ, 1989, පි. 56.
128 හේරත්, සමන්ත, සිංහල චිත්‍රපට ගීත සාහිත්‍යය, ගොඩගේ, කොළඹ, 1995, පි. 208.
129 එම, පි. 215.
130 ජයකොඩි පියතුමා, මර්සලින්, වෙසක් කැකුළු අතු අග හිඳ, දිවැස ප්‍රකාශකයෝ වැල්ලම්පිටිය, 1990, පි. 83.
131 අල්විස්, ප්‍රේමකීර්ති ද, සිහින සතක්, ගොඩගේ, කොළඹ, 1998, පි. 38.
132 වීරසිංහ, සමන් චන්ද්‍රනාත්, අපේ කාලේ සරස්වතී, කොළඹ, 1990, පි. 60.



133 අහුබුදු, අරිසෙන්, අතු අගැ දිළි වන මල්, ගොඩගේ, කොළඹ, 1987, පි. 51.
134 සිද්ධාර්ථ හිමි, රඹුකන, සසර දනව්ව, කොට්ටාව, 2006, පි. 27.
135 ආරියරත්න, සුනිල්, නවාතැන්පොළ, ගොඩගේ, කොළඹ, 1999, පි. 25.
136 එම, පි. 19.
137 එම, පි. 63.
138 ආරියරත්න, සුනිල්, ළා හිරු දහසක්, දයාවංශ ජයකොඩි, (වර්ෂ රහිතයි), පි. 21.
139 ආරියරත්න, සුනිල්, තුටු පඬුරු, ගොඩගේ, කොළඹ, 1994, පි. 35.
140 එම, පි. 51.
141 එම, පි. 55.
142 එම, පි. 57.
143 එම, පි. 119.
144 ආරියරත්න, සුනිල්, තනි යහනේ දී, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ, 1981, පි. 26.
145 එම, පි. 32.
146 එම, පි. 32.
147 එම, පි. 52.
148 එම, පි. 73.
149 එම, පි. 90.
150 හේරත්, සමන්ත සහ වෙත්තසිංහ, සමුද්‍ර, අජන්තා ගීතාවලී, ගොඩගේ, කොළඹ, 2002, පි. 173.
151 විජේසිංහ, රත්න ශ්‍රී, සුදු නෙළුම, ගොඩගේ, කොළඹ, 1993, පි. 73.
152 විජේසිංහ, රත්න ශ්‍රී, ඉරබටු තරුව, ගොඩගේ, කොළඹ, 1998, පි. 60.
153 සිද්ධාර්ථ හිමි, රඹුකන, සසර දනව්ව, කොට්ටාව, 2006, පි. 65.
154 එම, පි. 165.
155 සිද්ධාර්ථ හිමි, රඹුකන, සංසාරේ අපි, කොට්ටාව, 2005, පි. 92.
156 එම, පි. 101.
157 එම, පි. 108.
158 එම, පි. 114.
159 අහුබුදු, අරිසෙන්, අතු අගැ දිළි වන මල්, ගොඩගේ, කොළඹ, 1987, පි. 112.
160 ආරියරත්න, සුනිල්, තනි යහනේ දී, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ, 1981, පි. 48.
161 පෙරේරා, සුනිල් සරත්, පද්ම තටාකය, දීපානී, නුගේගොඩ, 1985, පි. 67.
162 ජයකොඩි පියතුමා, මර්සලින්, වෙසක් කැකුළු අතු අග හිඳ, දිවැස ප්‍රකාශකයෝ වැල්ලම්පිටිය, 1990, පි. 24.
163 ආරියරත්න, සුනිල්, මානවසිංහ ගීත නිබන්ධ, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 1991, පි. 49.
164 ආරියරත්න, සුනිල්, නූතනගේය කාව්‍ය සංහිතා, කොළඹ, 2005, පි. 200.
165 සිද්ධාර්ථ හිමි, රඹුකන, සසර දනව්ව, කොට්ටාව, 2006, පි. 196.
166 එම, පි. 53.
167 අහුබුදු, අරිසෙන්, අතු අගැ දිළි වන මල්, ගොඩගේ, කොළඹ, 1987, පි. 85.
168 ආරියරත්න, සුනිල්, නවාතැන්පොළ, ගොඩගේ, කොළඹ, 1999, පි. 41.

169 කුඩලිගම, ගීතනාත්, වික්ටර් රත්නායක ගී සියයක්, තරංජි ප්‍රින්ටර්ස්, මහරගම, 1997, පි. 94.
170 සිද්ධාර්ථ හිමි, රඹුකන, සසර දනව්ව, කොට්ටාව, 2006, පි. 59.
171 ආරියරත්න, සුනිල්, ළා හිරු දහසක්, දයාවංශ ජයකොඩි, කොළඹ, (වර්ෂ රහිතයි), පි. 17.
172 ආරියරත්න, සුනිල්, තුටු පඬුරු, ගොඩගේ, කොළඹ, 1994, පි. 43.
173 එම, පි. 112.
174 හේරත්, සමන්ත, සිංහල චිත්‍රපට ගීත සාහිත්‍යය, ගොඩගේ, කොළඹ, 1995, පි. 213.
175 විජේසිංහ, රත්න ශ්‍රී, සුදු නෙළුම, ගොඩගේ, කොළඹ, 1993, පි. 53.
176 පෙරේරා, සුනිල් සරත්, පද්ම තටාකය, දීපානී, නුගේගොඩ, 1985, පි. 54.
177 පෙරේරා, යමුනා මාලිනී, ආදරය සුන්දර වරදකි, සාර ප්‍රකාශන, කොට්ටාව, 2000, පි. 65.
178 අහුබුදු, අරිසෙන්, අතු අගැ දිළි වන මල්, ගොඩගේ, කොළඹ, 1987, පි. 70.
179 ආරියරත්න, සුනිල්, නවාතැන්පොළ, ගොඩගේ, කොළඹ, 1999, පි. 27.
180 හේරත්, සමන්ත සහ වෙත්තසිංහ, සමුද්‍ර, අජන්තා ගීතාවලී, ගොඩගේ, කොළඹ, 2002, පි. 247.
181 ජයකොඩි පියතුමා, මර්සලින්, වෙසක් කැකුළු අතු අග හිඳ, දිවැස ප්‍රකාශකයෝ වැල්ලම්පිටිය, 1990, පි. 94.
182 එම, පි. 99.
183 හේරත්, සමන්ත සහ වෙත්තසිංහ, සමුද්‍ර, අජන්තා ගීතාවලී, ගොඩගේ, කොළඹ, 2002, පි. 240.
184 ආරියරත්න, සුනිල්, මානවසිංහ ගීත නිබන්ධ, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 1991, පි. 59.
185 අභයසුන්දර, විමල්, සුර මුරලිය, ගොඩගේ, කොළඹ, 1989, පි. 70.
186 ආරියරත්න, සුනිල්, මානවසිංහ ගීත නිබන්ධ, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 1991, පි. 209.
187 එලු. ස., 80 ගීය සහ පි. 66.
188 එම, 81 ගීය සහ පි. 67.
189 එම, 82 ගීය සහ පි. 68.
190 එම, 83 ගීය සහ පි. 68.
191 එම, 84 ගීය සහ පි. 68, 69.
192 සිද්ධාර්ථ හිමි, රඹුකන, සසර දනව්ව, කොට්ටාව, 2006, පි. 60.
193 ආරියරත්න, සුනිල්, මානවසිංහ ගීත නිබන්ධ, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 1991, පි. 120.
194 ආරියරත්න, සුනිල්, නවාතැන්පොළ, ගොඩගේ, කොළඹ, 1999, පි. 33.
195 සිද්ධාර්ථ හිමි, රඹුකන, සසර දනව්ව, කොට්ටාව, 2006, පි. 48.
196 අහුබුදු, අරිසෙන්, අතු අගැ දිළි වන මල්, ගොඩගේ, කොළඹ, 1987, පි. 77
197 එම, පි. 97.
198 කාසිම්, නිලාර් එන්, පැහැසර අරුණක, සූරිය ප්‍රකාශකයෝ, කොළඹ, 1999, පි. 49.



## ආශ්‍රිත ග්‍රන්ථඃ

### ප්‍රාථමික මූලාශ්‍රයඃ


- **එලුසඳස්ලකුණ**, වැලිවිටියේ සෝරත හිමි සංස්කරණය, සමයවර්ධන, කොළඹ, 2004.
- **එළුසඳස්ලකුණ**, කරදන පඤ්ඤානන්ද හිමි සංස්කරණය, 1938 (?)
- **සාහිත්‍ය දර්පණ**, බාබු භුවනචන්ද්‍ර වසාක සංස්කරණය, කල්කතා, 1869.
- **සියබස්ලකර**, ලේල්වල ශ්‍රී සද්ධර්මාචාර්ය සිරිනිවාස හිමි, බෙන්තර ධර්මසේන ස්ථවිර, පණ්ඩිත හැගොඩ ධම්මින්ද ස්ථවිර සංස්කරණය ගොඩගේ, කොළඹ, 2002.


### නව නිර්මාණඃ


- අභයසුන්දර, විමල්, **සුර මුරලිය**, ගොඩගේ, කොළඹ, 1989.
- අල්විස්, ප්‍රේමකීර්ති ද, **සිහින සතක්**, ගොඩගේ, කොළඹ, 1998.
- අහුබුදු, අරිසෙන්, **අතු අගැ දිළි වන මල්**, ගොඩගේ, කොළඹ, 1987.
- ආරියරත්න, සුනිල්, **තනි යහනේ දී**, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ, 1981.
- ආරියරත්න, සුනිල්, **තුටු පඬුරු**, ගොඩගේ, කොළඹ, 1994.
- ආරියරත්න, සුනිල්, **නවාතැන්පොළ**, ගොඩගේ, කොළඹ, 1999.
- ආරියරත්න, සුනිල්, **නූතනගේය කාව්‍ය සංහිතා**, කොළඹ, 2005.
- ආරියරත්න, සුනිල්, **මානවසිංහ ගීත නිබන්ධ**, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 1991.
- ආරියරත්න, සුනිල්, **ළා හිරු දහසක්**, දයාවංශ ජයකොඩි, (වර්ෂ රහිතයි).
- කාසිම්, නිලාර් එන්, **පැහැසර අරුණක**, සූරිය ප්‍රකාශකයෝ, කොළඹ, 1999.
- කුඩලිගම, ගීතනාත්, **වික්ටර් රත්නායක ගී සියයක්**, තරංජි ප්‍රින්ටර්ස්, මහරගම, 1997.
- කුඩලිගම, ගීතනාත්, **සුළං කෝඩයක**, තරංජි ප්‍රින්ටර්ස්, මහරගම, 1998.
- ගමගේ, ධර්මසිරි, **සුළං කුරුල්ලෝ**, ගොඩගේ, කොළඹ, 1989.
- ජයකොඩි පියතුමා, මර්සලින්, **වෙසක් කැකුළු අතු අග හිඳ**, දිවැස ප්‍රකාශකයෝ වැල්ලම්පිටිය, 1990.
- පෙරේරා, යමුනා මාලිනී, **ආදරය සුන්දර වරදකි**, සාර ප්‍රකාශන, කොට්ටාව, 2000.
- පෙරේරා, සුනිල් සරත්, **පද්ම තටාකය**, දීපානී, නුගේගොඩ, 1985.
- රත්නායක, මඩවල, **ටිකිරි ලියා**, ගොඩගේ, කොළඹ, 1992.

- විජේසිංහ, රත්න ශ්‍රී, **ඉරබටු තරුව**, ගොඩගේ, කොළඹ, 1998.
- විජේසිංහ, රත්න ශ්‍රී, **සුදු නෙළුම**, ගොඩගේ, කොළඹ, 1993.
- වීරසිංහ, සමන් චන්ද්‍රනාත්, **අපේ කාලේ සරස්වතී**, කොළඹ, 1990.
- සම්පත්, බිහේෂ්, **හද බැඳි පැදි**, ගාල්ල, 2009.
- සිද්ධාර්ථ හිමි, රඹුකන, **සංසාරේ අපි**, කොට්ටාව, 2005.
- සිද්ධාර්ථ හිමි, රඹුකන, **සසර දනව්ව**, කොට්ටාව, 2006.
- හේරත්, සමන්ත, **සිංහල චිත්‍රපට ගීත සාහිත්‍යය**, ගොඩගේ, කොළඹ, 1995.
- හේරත්, සමන්ත සහ වෙත්තසිංහ, සමුද්‍ර, **අජන්තා ගීතාවලී**, ගොඩගේ, කොළඹ, 2002.


# වේදය


## පූජ්‍ය උඩවෙල රේවත හිමි



There are four Vedas which are the sacred texts of Hinduism such as the Rig Veda, Sama Veda, Yajur Veda and Atharva Veda. Scholars have determined that the Rig Veda, the oldest of the four Vedas, was composed about 1500 B.C., and compiled about 600 B.C. Besides its spiritual value, it also gives a unique view of everyday life in India four thousand years ago. The rigveda is also the most ancient extensive text in an Indo-European language and invaluable source in the study of comparative linguistics. The book is organized in ten texts known as mandalas of varying age and qualities. From two to seven sections are said to be "family books" that are considered the oldest and shortest components of Rigveda. The first & the Tenth Mandalas are the youngest and the longest texts. Each mandala consists of hymns called Sukta. Within each mandala the hymns are collocated in collections each dealing with a particular deity. Agni comes first and Indra comes second so forth. Within each section the hymns are regulated in the descending order.


ආයර්‍යයන්ගේ ප්‍රාචීනතම සාහිත්‍යය වේදයයි. භාරතයේ පමණක් නොව මුළු ලොව ම ඇති පැරණිතම සාහිත්‍යය මෙයයි. සෙසු සාහිත්‍යයන්හි ක්‍රමික වූ අඛණ්ඩ පරිපූර්ණ විකාශනයක් අප්‍රත්‍යක්ෂය. එහෙත් මෙය එලෙස කඩින් කඩ ලුප්ත නොවූ පරිපූර්ණ සාහිත්‍යයකි.[1] ඉන්දියාවට සංක්‍රමණය වූ ආදි ම ආයර්‍ය ගෝත්‍රිකයන්ගේ පැබඳුම්, හෘද්ගත භාවාත්මක චේෂ්ටාවන් අඩංගු ගීතිකාවන්ගෙන් වෛදික සංහිතා සාහිත්‍යය සකස්ව ඇත. ආයර්‍ය ගෝත්‍රිකයෝ ජීවිතය ප්‍රීතියෙන් ගතකළහ. ඔවුහු නිර්භීත වූ ද රණකාමී වූ ද ආගමික


© කථිකාචාර්ය පූජ්‍ය උඩවෙල රේවත හිමි



සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු

**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 22 කලාපය, 2014/2015**

මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය